# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 7 දරන ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 මාර්තු මස 27 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

## 2000 අංක 7 දරන ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 මාර්තු මස 27 වන දින]

එල්.ඩී.—ඕ. 92/93.

## ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් ඒ ආයතනයේ පරමාර්ථ සහ ඒ ආයතනයට සම්බන්ධ සියලු කාරණා ඒ ආයතනයේ සමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ඉෂ්ට කිරීම සඳහා 1988 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ සහ කාරණා පෙරදැරි කොට ගෙන ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් ඒ ආයතනය විසින් සාර්ථක ලෙස ඉටු කොට සහ ක්‍රියාත්මක කොට ඇති හෙයින් සහ ඒ ආයතනය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කොට ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

කෙටි නාමය.

1. මේ පනත 2000 අංක 7 දරන ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ අධිසාමාජිකයන් සහ ආශ්‍රිත සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන්පසු "ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් වන්නේ ය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :–

(අ) ණය කළමනාකරණය පිළිබඳ අධ්‍යයනය සහ වෘත්තිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම ;

(ආ) සංස්ථාවේ සාමාජිකත්වයට සාමාජිකයන් ඇතුළු කරගැනීම, සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සහ ණය කළමනාකරණය පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සහ ණය කළමනාකරණය පිළිබඳ සුදුසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන් පුහුණු කිරීම විධිමත් කිරීම, සංස්ථාවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය අධ්‍යයන පාඨමාලා නියම කිරීම සහ අනුමත කිරීම, එවැනි පාඨමාලා සහ විභාග පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු යෙදීම සහ ණය කළමනාකාරිත්ව ක්ෂේත්‍රයේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා වූ පිළිගත් අධ්‍යාපනික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඇ) සුදුසු ආයතනවලින් ණය කළමනාකරණ ආයතන පිළිගනු ලැබීමට ක්‍රියා කිරීම සහ එවැනි ආයතනවලට අනුබද්ධවීම ;

(ඈ) ණය කළමනාකරණ ක්ෂේත්‍රයේ ලා සිදු කරන ලද විශිෂ්ට සේවා සඳහා ප්‍රදාන සහ ත්‍යාග පිහිටුවීම හා පිරිනැමීම ;

(ඉ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් සංස්ථාවේ සාමාජිකයන්ගේ වෘත්තීය චර්යාවට අදාළ ප්‍රමිති නියම කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කරනු ලබන බවට වග බලා ගැනීම ;

(ඊ) ණය කළමනාකරණ වෘත්තියේ අර්ථ සිද්ධිය, තත්වය, සුභ සාධනය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද සහ ණය කළමනාකරණ වෘත්තියට අදාළව මහජනයාගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(උ) සම්මන්ත්‍රණ, සම්මේලන, මණ්ඩල, වැඩමුළු සහ රැස්වීම් සංවිධානය කිරීම සහ පැවැත්වීම ; සහ

(ඌ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය, ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු දේ කිරීම ;

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමට බලය සංස්ථාවට ඇත්තේ ය:– සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට, කෙළින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින්, ත්‍යාග, පරිත්‍යාග සහ රික්ථවරණ භාර ගැනීම ;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යැම ;

(ඉ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපි ලේඛන ප්‍රසිද්ධ කිරීම හෝ ප්‍රසිද්ධ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යැම ;

(ඊ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් අදහස් කරනු ලබන ආකාරයකට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇපමත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම ;

(උ) සංස්ථාවේ සාමාජිකත්වය, සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සහ සංස්ථාව විසින් නැතහොත් සංස්ථාව

වෙනුවෙන් පවත්වනු ලබන පාඨමාලාවලට සහ විභාගවලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් ගාස්තු, දයක මුදල් සහ සම්මාදම් මුදල් පනවා අයකර ගැනීම ;

(ඌ) ණය කළමනාකරුවන් වශයෙන් සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන් සේවයෙහි යෙදවීම, පුහුණු කිරීම, මාරු කිරීම සහ අස් කිරීම සම්බන්ධයෙන් නියමයන් සහ කොන්දේසි නියම කිරීම අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ විධිමත් කිරීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වා ගෙන යෑම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම ;

(ඒ) නේවාසිකාගාර පිහිටුවීම සහ පවත්වාගෙන යෑම ; සහ

(ඔ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සහ ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

5. (1) සංස්ථාවේ සභාපති, උප සභාපති, ගරු ලේකම්, ගරු උප ලේකම්, ගරු භාණ්ඩාගාරික, ගරු උප භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන වෙනත් සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විත වන (මෙහි මින් මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් විසින් සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) ඉටු කිරීමට මෙයින් සංස්ථාව වෙත බලය පවරනු ලැබූ සියලු දේ සංස්ථාව වෙනුවෙන් ඉටු කිරීමේ බලය පාලක සභාවට ඇති අතර, එහි කර්තව්‍ය කිසිවක්, එය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි, යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ආයතනයේ කළමනාකාර සභාවේ සාමාජිකයන්ව සිටි තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම සභාව සමන්විත විය යුතු ය.

6. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන් ඉල්ලා අස්වීම සහ සාමාජිකත්වයෙන් නෙරපීම, සංස්ථාවේ ධූර දරන්නන්ගේ බලතල, චර්යාව සහ කාර්ය, සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, සංස්ථාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ, වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ තත් කාර්යය සඳහා සති දෙකක් කල් දී කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එවැනි රීතියක් සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් එය වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ජින්න කිරීම කරනු ලැබිය හැකි ය. සංස්ථාවේ රීති.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනය ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලපැවැත් වූ ආයතනයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. (1) අධිසාමාජිකයන්ගෙන් සහ ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සංස්ථාවේ සාමාජිකත්වය සංයුක්ත වන්නේ ය. සංස්ථාවේ සාමාජිකත්වය.

(2) එසේ වුවද සභාව විසින් නියම කරනු ලබන පන්තිවලට අයත් වන්නා වූ සහ සභාව විසින් නියම කරනු ලබන වරප්‍රසාද සහ බැඳීම් සහිත වූ සංස්ථා සාමාජිකත්වයට සුදුසුකම් නොලබන්නාවූ ද තැනැත්තන්, සභාව විසින් සාමාජිකයන් නොවන තැනැත්තන් වශයෙන් ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයන් වූ සියලු තැනැත්තන් අවස්ථාවෝචිත පරිදි ඔවුන් දැරූ පන්තියට හෝ ශ්‍රේණියට අයත් සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් සියලු කාර්ය සඳහා පිළිගනු ලැබිය යුතු සහ සලකනු ලැබිය යුතු අතර මේ පනතේ සහ ඒ යටතේ සාදනු ලැබූ විධිවිධානවලට යටත්ව එවැනි සාමාජිකත්වය ඔවුන් විසින් දිගටම දැරිය යුතු ය.

සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන්.

8. අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන වෙනත් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ නිල නාම ඔවුන්ට පැවරීම සභාව විසින් කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ ගිණුම්.

9. සංස්ථාවට ලැබෙන සහ සංස්ථාව විසින් වියදම් කරනු ලබන සියලු මුදල් සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට සභාව විසින් කටයුතු යෙදිය යුතු අතර ඒ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් ලවා විගණනය කරවීමට කටයුතු යෙදිය යුතු ය.

අභිධාන පාවිච්චි කිරීමේ සුදුසුකම්.

10. (1) අවස්ථාවෝචිත පරිදි ණය කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජික සහ ණය කළමනාකරණ ආයතනයේ අධි සාමාජික යන අභිධාන පාවිච්චි කිරීමේ සහ, අවස්ථාවෝචිත පරිදි තම නාමයට පරව " ඒ. අයි. සී. එම්." හෝ "එෆ්. අයි. සී. එම්." යන යෙදුම් පාවිච්චි කිරීමේ, හිමිකම සෑම සාමාජිකයකුටම ඇත්තේ ය.

(2) ඉහත සඳහන් පරිදි හැර යටකී අභිධානයක් හෝ යෙදුමක් කිසිදු කාර්යයක් සඳහා වුවද කිසිදු තැනැත්තකු විසින් පාවිච්චි නොකළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. සභාපතිවරයා ද ලේකම් හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ද ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති ආයතනයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය හා ආයතනය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. ආයතනය විසින් ගෙවිය යුතු සහ ඊට අය විය යුතු ණය.

**13.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය සහ ගිණුම්.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්–

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්

අදහස් වේ.

**14.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන් ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස් කිරීම.

**15.** මේ පනතින් හෝ ඒ යටතේ හෝ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.